# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2011 අංක 33 දරන ශ්‍රී ලංකා ආර්ථික විද්‍යා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2011 ජූලි මස 19 වැනි දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2011 ජූලි මස 22 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

**මිළ : රු. 5.25 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

**2011 අංක 33 දරන ශ්‍රී ලංකා ආර්ථික විද්‍යා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත**

[සහතිකය සටහන් කළේ 2011 ජූලි මස 19 වැනි දින]

එල්.ඩී.—ඕ.(අයි.එන්.සී.) 14/2009

**ශ්‍රී ලංකා ආර්ථික විද්‍යා සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි**

"ශ්‍රී ලංකා ආර්ථික විද්‍යා සංගමය" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සංගමයක්, එකී සංගමයේ සාමාජිකයන් එකඟ වූ ව්‍යවස්ථාවලට අනුව එකී සංගමයට සම්බන්ධ සියලු කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ වගකීමෙන් සීමිත සමාගමක් වශයෙන් පිහිටුවා තිබූ අතර, 2007 අංක 07 දරන පනත යටතේ නැවත ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලා ඇති හෙයින් ද: පූර්විකාව.

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද, ඒ පරමාර්ථ හා කාරණා, එකී සංගමය විසින් මෙතෙක් කල් සාර්ථකව ක්‍රියාත්මක කර හා ඉටුකර ගෙන ගොස් ඇති හෙයින් ද, එකී සංගමය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද, එසේ සංස්ථාගත කිරීම ජනතා යහපතට හේතු වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 2011 අංක 33 දරන ශ්‍රී ලංකා ආර්ථික විද්‍යා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට හා ඉන්පසු (මෙහි මින් මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ආර්ථික විද්‍යා සංගමයේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් සහ මෙයින් පිහිටුවනු ලබන සංස්ථාවට සාමාජිකයන් වශයෙන් මින් මතු ඇතුළත් කර ගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "ශ්‍රී ලංකා ආර්ථික විද්‍යා සංගමය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් ඒ සංස්ථාව විසින් ද ඊට විරුද්ධව ද සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකි ය. තව ද, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද, පූර්ණ බලය හා අධිකාරය ඊට ඇත්තේ ය. ශ්‍රී ලංකා ආර්ථික විද්‍යා සංගමය සංස්ථාගත කිරීම.

2-PL 004988 -2,590 (2010/07)

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව පිහිටුවනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) ශ්‍රී ලංකාව තුළ සහ ඉන් පිටත ආර්ථික විද්‍යා ක්ෂේත්‍රයේ අධ්‍යයනයන් කිරීමට, ඒවා වැඩිදියුණු කිරීමට සහ ඒ සඳහා පහසුකම් සැලසීමට;

(ආ) මෙම ක්ෂේත්‍රයේ පර්යේෂණ කටයුතු සංවිධානය කිරීමට සහ ප්‍රවර්ධනය කිරීමට රජයේ සහ පෞද්ගලික අංශයේ සහ ජාත්‍යන්තර සංවිධාන සහ ආයතන සමග ඇති කරගත් ගිවිසුම් මත අධ්‍යයනයන් සහ පර්යේෂණයන් කිරීමට;

(ඇ) ආර්ථික විද්‍යා ක්ෂේත්‍රයේ ඉගැන්වීම් සහ පුහුණු කිරීමේ වැඩසටහන් සැලසුම් කිරීමට සහ සංවිධානය කිරීමට;

(ඈ) ආර්ථික විද්‍යාවට අදාළ වන විෂයයන් ගැන දැනුම සහ අවබෝධය වර්ධනය කිරීමේ අරමුණින් පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳව සිසුන් සහ වෙනත් අය පුහුණු කිරීමට;

(ඉ) ඵලදායි සමාජ - ආර්ථික ප්‍රතිපත්ති පිළියෙල කිරීම සඳහා සහය වීමට;

(ඊ) ආර්ථික සහ සමාජ සංවර්ධනයට අදාළව වාර්තා සකස් කර ඉදිරිපත් කිරීමට හෝ ආර්ථික සංවර්ධනය පිළිබඳ විෂයයට අදාළ වාර්තා සකස් කිරීමට;

(උ) ශ්‍රී ලංකාව තුළ සහ ඉන් පිටත ඇති මේ හා සමාන සංගම් සමග සහයෝගය, එකමුතුකම සහ මිත්‍රත්වය ප්‍රවර්ධනය කිරීමට; සහ

(ඌ) ශ්‍රී ලංකාවේ හෝ ජාත්‍යන්තර වශයෙන් ආර්ථික සහ සමාජයීය සංවර්ධනය ගැන සමීක්ෂණ සහ අධ්‍යයන, කිසියම් දේශීය හෝ විදේශීය ආයතනයන් සමග එක්ව කිරීමට, ප්‍රවර්ධනය කිරීමට හා පැවැත්වීමට.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව පහත සඳහන් බලතල ද ඇතුළුව, සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතුරින් කිසිවක් නංවාලීම හෝ වැඩි දියුණු කිරීම උදෙසා අවශ්‍ය හෝ හිතකර කවර හෝ ක්‍රියා, කාරණා හෝ දේ කිරීමට, ඉටුකිරීමට හා ක්‍රියාත්මක කිරීමට සංස්ථාවට බලය ඇත්තේ ය:— සංස්ථාවේ බලතල.

(අ) අරමුදල් රැස් කිරීම සහ මුදලින් හෝ ද්‍රව්‍යමය වශයෙන් හෝ ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග භාර ගැනීම;

(ආ) චංචල හෝ නිශ්චල දේපළ කවර හෝ ආකාරයකින් අත්කර ගැනීම, දැරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම සහ සංස්ථාවේ කටයුතු සඳහා අවශ්‍ය හෝ පහසුවක් වන යම් ගොඩනැගිලි හෝ නිර්මාණ ඉදි කිරීම, නඩත්තු කිරීම සහ ඒවායේ වෙනස්කම් කිරීම;

(ඇ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගනුදෙනු කළ හැකි සාධන පත්‍ර සෑදීමට, ලිවීමට, භාර ගැනීමට, වට්ටම් කිරීමට, පිටසන් කිරීමට, ගනුදෙනු කිරීමට, මිලට ගැනීමට, විකිණීමට හෝ නිකුත් කිරීමට සහ යම් බැංකුවක බැංකු ගිණුම් විවෘත කිරීම, පවත්වාගෙන යාම හා වැසීම සහ ඇප ඇතිව හෝ නොමැතිව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම;

(ඈ) සංස්ථාවේ කාර්ය සඳහා වහා ම අවශ්‍ය නොවන මුදල් කළමනාකරණ සභාව තීරණය කරන ආකාරයට ආයෝජනය කිරීම;

(ඉ) මේ අරමුණු ක්‍රියාත්මක කිරීමේ දී යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් සමග ගිවිසුම්වලට හෝ කොන්ත්‍රාත්තුවලට ඇතුළත් වීම;

(ඊ) විවිධ සාමාජිකයන්ගේ වර්ගීකරණය කිරීම සඳහා ලියාපදිංචි වීමට ගෙවිය යුතු ගාස්තු තීරණය කිරීම; සහ

(උ) සංස්ථාවේ නිලධරයන් හා සේවකයන් පත් කිරීම, සේවයෙහි නියුක්ත කිරීම, සේවයෙන් පහ කිරීම හෝ සේවය අවසන් කිරීම සහ සංස්ථාව විසින් තීරණය කරනු ලබන යම් වැටුප්, දීමනා සහ පාරිතෝෂික ඔවුන්ට ගෙවීම.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5.** (1) සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම, පාලනය කිරීම සහ පරිපාලනය කිරීම (මෙහි මින් මතු “සභාව” යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකරණ සභාවක් වෙත මේ පනතේ විධිවිධාන යටතේ සහ 6 වන වගන්තිය යටතේ සාදනු ලබන යම් රීතියකට යටත්ව පැවරෙන්නේ ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී සංගමයේ පාලක සභාවේ සාමාජිකයන් වශයෙන් ධුර දැරූවා වූ සාමාජිකයන් සංස්ථාවේ ප්‍රථම සභාවේ සාමාජිකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

සංස්ථාවේ රීති.

**6.** (1) සංස්ථාව විසින් සාමාජිකයන්ගේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් මේ පනතට අනනුකූල නොවන රීති පහත දැක්වෙන සියලු කාරණා සඳහා හෝ ඉන් කිසිවක් සඳහා කලින් කල සෑදීම නීත්‍යනුකූල වන්නේ ය:—

(අ) සාමාජිකයන් වර්ග කිරීම, එක් එක් පන්තියට අයත් සාමාජිකයන් විසින් ගෙවිය යුතු ගාස්තු, ඔවුන් ඇතුළත් කර ගැනීම, ඔවුන් ඉවත් කිරීම හෝ නෙරපීම හෝ ඔවුන්ගේ ඉල්ලා අස්වීම සහ සාමාජික නාමලේඛනයක් පවත්වාගෙන යාම;

(ආ) සභාවේ ධුර දරන්නන් තෝරා පත්කර ගැනීම, සභාවේ නිලධරයන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් ධුරයෙන් ඉවත් කිරීම හෝ ධුර අත් හැරීම සහ සභාවේ ධුර දරන්නන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්, නියෝජිතයන් සහ සේවකයන් පත් කිරීම, ඔවුන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය සහ වාර සහ කොන්දේසි;

(ඈ) සභාවේ, සංස්ථාවේ හෝ යම් අනුකාරක සභාවක රැස්වීම් සඳහා අවශ්‍ය ගණපූරණය හා එම රැස්වීම්වල කටයුතු කරගෙන යා යුතු ආකාරය ද ඇතුළුව රැස්වීම කැඳවීම සහ පැවැත්වීම පිළිබඳ කාර්ය පටිපාටිය;

(ඉ) සංස්ථාවේ හා සභාවේ සාමාජිකත්වය සඳහා සුදුසුකම් සහ නුසුදුසුකම්; සහ

(ඊ) සංස්ථාවේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා සංස්ථාවේ දේපළ පරිපාලනය හා කළමනාකරණය කිරීම.

(2) (1) වන උපවගන්තිය යටතේ සංස්ථාව විසින් සාදනු ලැබූ යම් රීතියක් වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම, සංශෝධනය කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම, (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදන ලද ආකාරයට ම එවැනි ම රැස්වීමක දී කළ යුතු ය.

(3) මේ වගන්තිය යටතේ සාදන ලද රීතිවලට සෑම විට ම සංස්ථාවේ සාමාජිකයන් යටත් විය යුතු ය.

සංගමය සතු දේපල ආදිය සංස්ථාව වෙත සතුවීම.

7. (1) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට—

(අ) සංගමයට අයත්ව තිබූ චංචල හෝ නිශ්චල සියලු දේපල ද;

(ආ) සංගමයේ සියලු අයිතිවාසිකම්, බලතල, වරප්‍රසාද සහ සම්බන්ධතා සහ සංගමයේ සියලු බැරකම් ද;

(ඇ) සංගමයේ සියලු පොත්, ගිණුම් සහ ලේඛන ද,

සම්පූර්ණයෙන් සංස්ථාව වෙත සතු විය යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ (1) වන උපවගන්තියේ ව්‍යාප්තියට හානියක් නොවන පරිදි—

(අ) සංගමයට ගෙවිය යුතු සියලු ණය, දායක මුදල් සහ ගාස්තු සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය;

(ආ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනට පෙරාතුව ම වූ දින සිට සංගමයේ සියලු බැරකම්, සංස්ථාවේ බැරකම් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඇ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනට පෙරාතුව ම වූ දින සිට සංගමයේ සියලු නිලධරයන් සහ සේවකයන්, සංස්ථාවේ නිලධරයන් සහ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඇ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනට පෙරාතුව ම වූ දින සිට පැවති සංගමයේ කාර්ය සඳහා ඇතුළත් වූ සියලු කොන්ත්‍රාත්තු සහ ගිවිසුම්, සංස්ථාව විසින් ඇතුළත් වූ කොන්ත්‍රාත්තු සහ ගිවිසුම් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඉ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනට පෙරාතුව ම වූ දින සිට විනිශ්චයට භාජනයව පැවතියා වූ සංගමය විසින් හෝ ඊට විරුද්ධව පවරනු ලැබ ඇත්තා වූ සියලු නඩු හා නඩු කටයුතු, සංස්ථාව විසින් හෝ ඊට විරුද්ධව හෝ පවරන ලද නඩු හෝ නඩු කටයුතු හෝ ලෙස සලකනු ලැබිය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

**8.** (1) සංස්ථාවට එහි ම අරමුදලක් තිබිය යුතු අතර, සංස්ථාව සඳහා සහ වෙනුවෙන් ත්‍යාග, රික්තවරණ, තෙස්තමේන්තු නීයාදන, ප්‍රදාන, පරිත්‍යාග, දායක මුදල් හෝ ගාස්තු, මුදලින් හෝ ද්‍රව්‍යමය වශයෙන් තිබිය යුතු ය.

(2) සංස්ථාවට ලැබෙන සියලු මුදල් සභාව විසින් තීරණය කරනු ලබන බැංකු එකක හෝ වැඩි ගණනක සංස්ථාවේ නමින් තැන්පත් කරනු ලැබිය යුතු අතර, සංස්ථාවේ සභාව විසින් තීරණය කරනු ලබන පරිදි සංස්ථාවේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට හැකිවන පරිදි එම මුදල් ආයෝජනය කළ යුතු ය.

(3) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හා ඉටු කිරීමේ දී සංස්ථාව විසින් දරන ලද වියදම් කිසිවක් පියවීමට අවශ්‍ය සියලු මුදල් සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

ගිණුම් හා විගණනය.

**9.** (1) සංස්ථාව විසින් එහි ආදායම සහ වියදම, වත්කම් සහ බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(2) සංස්ථාවේ ගිණුම්, සභාව තීරණය කරන පරිදි සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තියේ "සුදුසුකම් ලත් විගණකවරයා" යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ

සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ආ) ගණකාධිකාරී ආයතනයක එක් එක් නේවාසික හවුල්කරු, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද, එවැනි වරලත් ගණකාධිකාරී ආයතනයක්,

අදහස් වේ.

සංගමය විසින් ගෙවිය යුතු සහ සංගමයට අයවිය යුතු ණය.

10. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනට පෙරාතුව ම වූ දිනයේ දී සංගමය විසින් ගෙවිය යුතු සියලු ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට සංගමයට අයවිය යුතු සියලු ණය, දායක මුදල් සහ සම්මාදම් මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව වෙත ගෙවනු ලැබිය යුතු ය.

විසුරුවා හැරීමෙන් පසු ඉතිරි වන දේපළ.

11. සංස්ථාව විසුරුවා හැරීමේ දී, එහි සියලු ණය සහ බැරකම් ගෙවා සමථයට පත්කිරීමෙන් පසු කවර හෝ යම් දේපලක් ඉතිරි වුවහොත්, ඒ දේපල සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදා දෙනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපලක් ස්වකීය සාමාජිකයන් අතර බෙදා දීම රීති මගින් තහනම් කර ඇත්තා වූ ද, වෙනත් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපල දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. එම ආයතනය හෝ ආයතන කවරේ ද යන්න සංස්ථාව විසුරුවා හැරීමේ දී හෝ ඊට පෙර, සංස්ථාවේ සභාව විසින් තීරණය කළ යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

12. ලේකම්වරයා හෝ සභාව විසින් යථා පරිදි බලය දෙනු ලැබූ සභාවේ සාමාජිකයකු හා සභාවේ තවත් සාමාජිකයකු ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කවර වුව ද සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. තව ද, එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලැබූ අත්සනකට පරිබාහිරව විය යුතු ය.

සාමාජිකයන්ගේ වගකීම සීමා කිරීම.

13. සංස්ථාවේ කිසිම සාමාජිකයකු ඔහුගෙන් සංස්ථාවට අය විය යුතු වාර්ෂික දායක මුදල් ප්‍රමාණය ඉක්මවන යම් මුදලක් සංස්ථාවේ ණය සහ බැරකම් නිදහස් කිරීමේ කාර්යය සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා ගෙවීමට යටත් නොවිය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

14. ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

15. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.